2014.09.04

**පොදු චක්‍රලේඛ අංක - 02-125/2014**

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික රෝහල.
සියළු ම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂකවරුන්,
සියළු ම විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානීන්,
විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂකවරු සහ ආයතන ප්‍රධානීන් වෙත,

<u>**විශ්‍රාමික හෙද කාර්යය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයට බඳවා ගැනීම.**</u>

2016.12.31 දින දක්වා වසරින් වසර දීර්ඝ කිරීමට යටත්ව කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික හෙද නිලධාරීන් III ශ්‍රේණියේ හෙද නිලධාරීන් ලෙස නැවත සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ අංක අමප/14/0748/509/043 හා 2014.07.18 දිනැති ලිපියෙන් දන්වා ඇත.

02. ඒ අනුව පහත සුදුසුකම් සම්පූර්ණ කරන විශ්‍රාමික හෙද /හෙදි නිලධාරීන්ට ඒ සඳහා අයදුම් කළ හැක.

I. 2016.12.31 දිනට වයස අවරුදු 63ට අඩු විය යුතුය.

II. අවම වශයෙන් වසරක කාලසීමාවක් සේවයේ යෙදීමට හැකියාව ඇති හෙද නිලධාරියෙකු විය යුතුය.

III. විනය කටයුතු නොමැතිව සාමාන්‍ය පරිදි අනිවාර්යය විශ්‍රාම ගන්වා ඇති නිලධාරියෙකු විය යුතුය.

IV. වෛද්‍ය නිර්දේශයකින් තවදුරටත් සේවය කළ හැකි බවට තහවුරු කර තිබිය යුතුය.

03. විශේෂ ශ්‍රේණියේ තනතුරු වල හා I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍ය) තනතුරු වල සේවයේ යෙදී සිට විශ්‍රාම ගන්නා ලද හෙද නිලධාරීන් ද කොන්ත්‍රාත් පදනමින් නැවත සේවයේ යෙදීමට අනුමැතිය ඉල්ලන්නේ නම්, ඔවුන් ද III ශ්‍රේණියේ හෙද නිලධාරීන් ලෙස නැවත සේවයේ යෙදවීමට අනුමැතිය ලබා දෙන අතර, ඔවුන්ට විශේෂ ශ්‍රේණිය හා I ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍ය) තනතුරු වල සේවයේ යෙදීමට හිමිකමක් නොමැති බව සැළකිය යුතුය.

04. අයදුම් කළ යුතු ආකාරය,

I. මේ වන විට සේවයේ යෙදී සිටින, අනිවාර්යය විශ්‍රාම ගැනීමට නියමිත යම් හෙද නිලධාරියෙකු වේ නම්, ඔවුන් විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව ඇමුණුම 01 ප්‍රකාරව සකස් කරන ලද අයදුම් පත්‍රයක් විශ්‍රාම ගන්නා විටදී සේවය කරන ලද රෝහලේ /ආයතනයේ ප්‍රධානිගේ නිර්දේශය සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

II. මේ වන විට අනිවාර්යය විශ්‍රාම ගන්වා ඇති හෙද නිලධාරීන් නැවත සේවයේ යෙදීමට අයදුම් කරන්නේ නම්, එම නිලධාරීන් ද තමන් අවසන් වරට සේවය කරන ලද ආයතනයේ ආයතන ප්‍රධානියා මඟින් ඔහුගේ නිර්දේශය සහිතව ඇමුණුම 01 ආකෘති පත්‍රය සමඟ අයදුම්පත් යොමු කළ යුතුය.

05. නැවත සේවයේ යොදවන නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007 අනුව ගෙවීම් සිදු කරන අතර, හෙද නිලධාරී තනතුරට අදාළ අනෙකුත් දීමනා සියල්ල ලබා ගැනීමට හිමිකම් ඇත.

06. සැළකිය යුතුයි,

I. අමාත්‍යාංශයේ ලිඛිත අනුමැතිය ලැබෙන තෙක් විශ්‍රාමික හෙද නිලධාරියෙකු නැවත සේවයේ යොදවා ගැනීමට අදාළ රෝහල් වල ප්‍රධානීන් කටයුතු නො කළ යුතුය.
II. අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුත්තේ ඇමුණුම 01 ප්‍රකාරව සකස් කර ගන්නා ලද අයදුම් පත්‍ර පමණි.
III. අදාළ අයදුම් පත්‍රය සමඟ පහත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.
   a) නිලධාරියාගේ ජීව දත්ත පත්‍රිකාව.
   b) නිලධාරියාගේ ඉල්ලීම.
   c) ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කරන ලද ඇමුණුම 01 ආකෘති පත්‍රය.
   d) නිලධාරියා විශ්‍රාම ගන්වන ලද ලිපියේ සහතික කළ පිටපත. (මේ වන විට විශ්‍රාම ගන්වා ඇති නිලධාරීන් පමණි)
   e) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
   f) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත.
   g) වෛද්‍ය වාර්තාව.

07. අයදුම්පත් පහත ලිපිනය වෙත යොමු කරන්න.

අධ්‍යක්ෂ (හෙද පාලන) II.
සෞඛ්‍ය අමාත්‍යාංශය.
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

සුධර්මා කරුණාරත්න.
ලේකම්.
සෞඛ්‍ය අමාත්‍යාංශය.

පිටපත්, 1. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.
2. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
3. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
4. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව.

04.09.2014

**General Circular Number –** 02-125/2014

Director, National Hospital of Sri Lanka.
All Directors of Teaching Hospitals,
All Heads of Decentralized Units,
Directors of Specialized Campaigns and,
Heads of Institutions.

**Re – employment of Retired Nursing Officers on Contract Basis.**

It has been informed by the letter number අමප/14/0748/509/043 dated 18.07.2014 of the Secretary to the Cabinet of Ministers, that the Cabinet Approval has been received to re-employ the retired Nursing Officers in the post of Nursing Officer in Grade III on contract basis subject to extension of period year by year up to 31.12.2016.

02. Accordingly, retired Nursing Officers who possess follows qualifications are eligible to apply for this post.

I. Should be less than 63 years of age as at 31.12.2016.

II. Should be a Nursing Officer who is able to serve for at least a period of one year.

III. Should be a Nursing Officer who has been retired compulsorily according to the general procedure without disciplinary actions.

IV. Should be certified by a medical recommendation that he/she is able to serve further.

03. If retired Nursing Officers who served in the posts of Nursing Officer in Special Grade and Grade I (Education, Hospital Service, Public Health) also seek for the approval to be re-employed, approval is granted to re-employ team in the post of Nursing Officer in Grade III. However, they are not eligible to serve in the posts of Nursing Officer in the Special Grade or Grade I (Education, Hospital Service, Public Health)

04. Method of Application

I. Nursing Officers who are currently in the service and are to be retired compulsorily should submit after the retirement an application prepared in accordance with the attachment of to the Minister of Health with the recommendation of the Head of Hospital / Institution where he /she served at the time of retirement.

II. If the Nursing Officers who have already been retired compulsorily apply for re-employment, such Officers should also forward an application along with the form attachment of through the Head of institution where the Officer served for the last time with has recommendation.

05. Payments will be made in terms of P.A.C. No 09/2007 for the Officers who will be re- employed and they are entitled to all other allowance relevant to the post of Nursing Officer.

06. N.B.

I. Heads of Hospitals should not take actions to re-employ retired Nursing Officers until the written approval of the Ministry is received.

II. Applications prepared in accordance with the attachment of should only be forwarded for approval.

III. Follows documents should be submitted along with the applications.

   a. Bio-data of the Officer.
   b. request of the Officer.
   c. Form attachment of submitted with the recommendation of the Head of Institution.
   d. Certified copy of the letter of retirement of the Officer. (only the Officers who have already been retired )
   e. Certified copy of the National Identity Card.
   f. Certified copy of the birth certificate.
   g. Medical report.

07. Send the applications to the following address.

Director (Nursing Administration) II
ministry of Health
No 385, rev. Baddegama Wimalawansha Thero Mawatha,
Colombo 10.

Sudharma Karunarathne
Secretary.
Ministry of Health.

Copy, 1. Secretary to the Cabinet of Ministers.
2. Secretary, Ministry of Public Administration and Home Affairs.
3. Secretary, Public Service Commission.
4. Secretary, National salaries and Cadre Commission.